ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

09395

# පෙරහුරු පරීක්ෂණය - 2023(2024)

| 11 ශ්‍රේණිය | ඉතිහාසය - I | කාලය : පැය 01 යි. |
|---|---|---|

සැලකිය යුතුයි.
I. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 80 ක් හිමි වේ.
II. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

01. මහාවංශයේ මුල් කොටස රචනා වී ඇත්තේ මින් කිනම් සියවසක ද?
1. ක්‍රි.පූ. 5 හෝ 6වන සියවස
2. ක්‍රි.ව. 3 හෝ 4වන සියවස
3. ක්‍රි.පූ. 4 හෝ 5වන සියවස
4. ක්‍රි.ව. 5 හෝ 6වන සියවස

02. ගල්, මැටි පුවරු, බිත්ති, තඹ තහඩු, රන් තහඩු, දැව හා විවිධ භාජන ආදියෙහි ලියා ඇති පැරණි ලේඛන පොදුවේ හැඳින්වීමට යෙදෙන ව්‍යවහාරය වන්නේ මින් කුමක් ද?
1. පුරාවස්තු 2. සෙල්ලිපි 3. නටබුන් 4. අභිලේඛන

03. මුල් ඓතිහාසික යුගයේ මුල් කාලීනව ජනතාව කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය රැස් කර ගැනීමට වැඩි නැඹුරුවක් දැක්වූයේ මින් කුමන ක්‍රමයක් අනුගමනය කිරීමෙන් ද?
1. වැව් තැනීමෙන් ජලය රැස් කර ගැනීම
2. අමුණු බැඳ ජලය රැස් කර ගැනීම
3. ගංගා ජලය ප්‍රයෝජනයට ගැනීම
4. ඇළ මාර්ග මඟින් ජලය ප්‍රයෝජනයට ගැනීම

04. පොත් පත් කියවීමේ දී ඓතිහාසික සිදුවීම් පිළිබඳව විවිධ කරුණු, අදහස් හා මතවාද හමුවන බැවින් කියවන්නා තුළ,
1. විචාර බුද්ධිය දියුණු වේ.
2. පෞරුෂය ගොඩනැගේ
3. නිර්මාණාත්මක පිළිතුරු සපයයි.
4. ගැටලු විසඳාගත හැකිවේ.

05. අනුරාධපුරයේ නාගරික නැඟීමට සෘජු බලපෑමක් එල්ල කළ හා ශ්‍රී මහා බෝධීන් වහන්සේ ලංකාවට වැඩම කළ මෙන්ම පොළොන්නරු යුගයේ ප්‍රධානතම වරායක් දැක්වෙන නිවැරදි පිළිතුර වන්නේ මින් කුමක් ද?
1. මාතොට, දඹකොළපටුන, ගෝකණ්ණතිත්ථ.
2. ලංකාපටුන, මාගම, කාලතිත්ථ.
3. කසාතොට, මාතොට, පේදුරුතුඩුව
4. පල්ලවංක, මඩකලපුව, දඹකොළපටුන

06. හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් නැට්වුක්කන්ද නමින් හැඳින්වෙන ස්ථානයේ තිබෙන සෙල්ලිපියෙහි සඳහන් වන්නේ මින් කුමන ශිල්පියෙකු පිළිබඳව ද?
1. කවියෙකු 2. නැටුම් ශිල්පියෙකු 3. කැටයම් ශිල්පියෙකු 4. චිත්‍ර ශිල්පියෙකු

07. ශ්‍රී ලංකාවේ අතීතයේ රාජ්‍යත්වය හිමි වූ ආකාරය අනුව පහත I තීරුව II තීරුව හා ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර මින් කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| A - පියාගෙන් පුතුට | E - සද්ධාතිස්ස රජු |
| B - සහොදරයාගෙන් සහෝදරයාට | F - ශ්‍රී වික්‍රම රාජසිංහ රජු |
| C- රජුගේ බිරිඳගේ සොයුරාට | G - තුන්වන විජයබාහු රජු |
| D - රජුගේ සොයුරියගේ පුත්‍රයාට | H - වංකනාසිකතිස්ස රජු |

1. EGHF 2. HEFG 3. GHFE 4. FGEH

08. අනුරාධපුරයේ විසූ පර්සියානු ජාතික වෙළෙඳුන් කණ්ඩායමක් පිළිබඳ සඳහන් කරන්නේ මින් කුමන පුද්ගලයෙකු ද?
1. කොස්මොස් ඉන්ඩිකොප්ලේටස්
2. අල්බලසූරිය
3. ඉබ්න් ශහ්රියර්
4. ඉබන් බතූතා

09. ක්‍රි.ව.පස්වන ශතවර්ෂයේ දී ශ්‍රී ලංකාවේ පැවති රාජසභා කලාවේ ස්වභාවය පෙන්නුම් කරන චිත්‍ර දක්නට ලැබෙන්නේ මින් කුමන ස්ථානයකද?
1. රන්මසු උයනෙහි
2. මහා පරාක්‍රමබාහු රජුගේ රජ මාළිගයේ
3. නිශ්ශංක ලතා මණ්ඩපයේ
4. සීගිරි පර්වතයේ

10. පූර්ව ඓතිහාසික යුගයේ වැසියන් දහනයේ දී ඔක්සිජන් අවශ්‍ය බව දැන සිටි බවට හමුවන සාක්ෂියක් වන්නේ මින් කුමන නිර්මාණයක්ද?
1. උඩරංචාමඩම නිවස
2. මැටි පබළුව
3. කාල රක්ත මැටි බඳුන
4. හරණී සුසාන

- පහත සඳහන් තොරතුරු ඇසුරින් 11, 12 හා 13යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  - A - දැදිගමට අමතරව තවත් රාජධානි දෙකක් බිහිවීම.
  - B - ඊජිප්තුවේ සමඟ තානාපති සබඳතා ගොඩනගා ගැනීම.
  - C - පස්යොදුන් රට සිංහල පෙරළිය නමින් හැඳින්වෙන කැරැල්ලක් ඇති වීම.
  - D - තෙවන පරාක්‍රමබාහු රජු පොළොන්නරුවේ පාලන කටයුතු සිදු කිරීම.
  - E - ඉබන් බතූතා නම් අරාබි සංචාරකයෙකු ලංකාවට පැමිණීම.
  - F - අවසන් වරට රට එක්සේසත් කිරීම.

11. ඉහත සඳහන් තොරතුරු ඇසුරින් ගම්පොළ යුගයේ දැක ගත හැකි තොරතුරු අඩංගු පිළිතුර වන්නේ මින් කුමක්ද?
1. A, C
2. B, D
3. C, F
4. A, E

12. යාපහුව රාජධානි සමයට අයත් තොරතුරු පමණක් අඩංගු පිළිතුර වන්නේ මින් කුමක් ද?
1. A, F
2. B, D
3. D, F
4. C, F

13. කෝට්ටේ රාජධානි සමයේ සිදුවූ සිදුවීම් ඇතුලත් පිළිතුර වන්නේ මින් කුමක් ද?
1. A, C
2. B, D
3. C, F
4. B, E

14. පොළොන්නරු රාජධානිය බිඳ වැටීමට බලපෑ ආසන්නතම හේතුව වන්නේ මින් කුමක් ද?
1. දුර්වල පාලකයන් බලයට පත්වීම
2. කාලිංග හා පාණ්ඩ්‍ය වංශිකයන් අතර බල අරගල
3. කාලිංග මාඝගේ ආක්‍රමණය
4. ආර්ථික පරිහානිය

15. පහත I තීරුව හා II තීරුව හා ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර මින් කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| A - අමණ්ඩගාමිණී අභය රජු | E - නිසි කලට සී සෑම නොකරණ පුද්ගලයන්ට දඩ ගැසීම |
| B - හතරවන මිහිඳු රජු | F - ජලාශවල ජීවත්වන පක්ෂීන් නොමැරිය යුතු බව |
| C- නිශ්ශංකමල්ල රජු | G - කිසිදු සතෙකු නොමැරිය යුතු බව |
| D - හතරවන කාශ්‍යප රජු | H - මී හරකුන් වැනි සතුන් මරණ අයට මරණ දණ්ඩනය දීම |

1. GHEF
2. HEFG
3. GHFE
4. FGEH

16. දේවපතිරාජ නම් ඇමති යොදවා රටේ ආර්ථික, ආගමික හා අධ්‍යාපනික අංශවල ප්‍රබල දියුණුවක් ඇති කිරීමට කටයුතු කළේ මින් කුමන රජුද?
1. තුන්වන පරාක්‍රමබාහු රජු
2. හත්වන පරාක්‍රමබාහු රජු
3. දෙවන විජයබාහු රජු
4. දෙවන පරාක්‍රමබාහු රජු

- පහත සඳහන් තොරතුරු ඇසුරින් 17 හා 18 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  - A - පාලන කටයුතුවල දී රජු වැදගත් වූ අතර රජු වටා සියලු බලතල ඒකරාශී වීම.
  - B - රජුට වඩා බලයක් ප්‍රාදේශීය වංශාධිපතීන් භුක්ති විඳීම.
  - C - මධ්‍යම පාන්තිකයන්ගෙන් රජු සහාය ලබා ගැනීම.
  - D - එක් එක් ප්‍රදේශ පාලනය කිරීමේ බලය ප්‍රාදේශීය පාලකයන්ට පවරා තිබීම.

17. ඉහත සඳහන් තොරතුරු ඇසුරින් වැඩවසම් සමයේ යුරෝපයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ ඇතුලත් පිළිතුර මින් කුමක්ද?
1. A, D
2. B, D
3. A, B
4. B, C

18. යුරෝපයේ පුනරුද සමයේ දේශපාලන නවෝදයේ සිදු වූ වැදගත් සිදුවීම් ඇතුලත් පිළිතුර මින් කුමක් ද?
1. B, C
2. A, D
3. A, C
4. C, D

19. ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ ලන්දේසි බලකොටු පවත්වාගෙන ගිය ස්ථාන ඇතුලත් නිවැරදි පිළිතුර මින් තෝරන්න.
1. යාපනය, හැමන්හෙයිල්, පුනරින්
2. කල්පිටිය, යාපනය, මන්නාරම
3. අරිප්පු,මන්නාරම, මුලතිව්
4. ෆෙඩ්රික් කොටුව, කොඩඩියාර්, යාපනය

20. ක්‍රි.ව.1580 දී පමණ උඩරට රාජධානිය පළමුවන රාජසිංහ රජුට යටත් කර ගැනීමට උපකාර කළේ මින් කුමන පුද්ගලයා ද?
1. කොනප්පු බණ්ඩාර
2. යමසිංහ බණ්ඩාර
3. වීරසුන්දර බණ්ඩාර
4. කරලියැද්දේ බණ්ඩාර

• පහත සඳහන් වගුව උපයෝගී කරගෙන 21 හා 22 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| වර්ෂය | සටන සිදුවූ ස්ථානය | පෘතුගීසි නායකයා |
|---|---|---|
| A - 1602 | D - දන්තුරේ | G - දියෝගෝ ද මෙලෝ |
| B - 1594 | E - ගන්නෝරුව | H - දොන් ජෙරනිමෝ ද අසවේදු |
| C - 1638 | F - බලන | I - පේරෝ ලෝපේස් ද සූසා |

21. පළමුවන විමලධර්මසූරිය රජු මුලින්ම පෘතුගීසීන්ට එරෙහිව කළ සටන හා සම්බන්ධ නිවැරදි පිළිතුර මින් කුමක්දැයි තෝරන්න.
1. C, E, G
2. B, D, I
3. A, F, H
4. B, F, G

22. දෙවන රාජසිංහ රජු අවසන් වරට පෘතුගීසීන් සමඟ සිදු කළ සටන හා සම්බන්ධ තොරතුරු ඇතුළත් නිවැරදි පිළිතුර මින් කුමක් ද?
1. A, F, G
2. B, D, I
3. A, E, H
4. C, E, G

23. කාර්මික විප්ලවය නිසා දේශපාලන ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස් කමක් වන්නේ මින් කුමක් ද?
1. මුදල් ආයෝජනය කළ හැකි ධනපති පන්තියක් බිහිවීම.
2. බද්ධ ව්‍යාපාර සමාගම් හා බහුජාතික සංගම් බිහිවීම.
3. ඇඩම්ස්මිත් ධනවාදී අර්ථ ක්‍රමය විග්‍රහ කිරීමත් එය ව්‍යාප්ත වීමත්ය.
4. කාර්මික නගර ලෝකයේ බිහිවීමත් ජනගහණය වැඩි වීමත්ය.

24. පහත තොරතුරු ඇසුරින් ගල් අඟුරු කර්මාන්තය හා සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය මින් තෝරන්න.
1. බ්‍රිතාන්‍ය ගල් අඟුරු වලින් බහුල රටකි.
2. ජේම්ස් වොට් විධිමත් වාෂ්ප එන්ජිමක් නිපදවීම.
3. හෙන්රි කෝට් රෝලර් යන්ත්‍රය නිපදවීම.
4. හම්ප්‍රි ඩේවි ආරක්ෂක ලාම්පුව නිපදවීම.

25. මධුරාසි පාලනය යටතේ මෙරට මුහුදුබඩ ප්‍රදේශවල ආදායම් එකතු කිරීමේ කටයුතු කළ සහකාර පරීක්ෂකවරු වන්නේ,
1. අවුමිල්දාර්වරු
2. කලෙක්ටර්වරු
3. රෙසිඩන්ටර්වරු
4. දේශීය නිලධාරීන්

• පහත සඳහන් වගුව උපයෝගී කරගෙන 26 සිට 29 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු තෝරන්න.

| | | |
|---|---|---|
| A - 1832 වර්ෂය | E - පානදුරා වාදය | I - සිද්දි ලෙබ්බේ මහතා |
| B - 1882 වර්ෂය | F - මාසික තෑග්ග | J - මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි |
| C - 1873 වර්ෂය | G - ශිවංගල විද්‍යාලය | K - චර්ච් මිෂනාරි සමාගම |
| D - 1872 වර්ෂය | H - නෙයිසන් | L - ආරුමුග නවලාර් තුමා |

26. ඉහත තොරතුරු අනුව හෙන්රි ස්ටිල් ඕල්කට් තුමා ලංකාවට පැමිණීමට හේතුවක්වන තොරතුරු ඇතුලත් නිවැරදි පිළිතුර මින් කුමක්ද?
1. B, G, I
2. C, E, J
3. C, F, L
4. B, H, I

27. මුස්ලිම් ජනතාව තුළ අධ්‍යාපනික ප්‍රබෝධයක් ඇතිකරලීමට සමත් තොරතුරු ඇතුළත් නිවැරදි පිළිතුර මින් කුමක්ද?
1. B, H, I
2. C, G, K
3. D, F, J
4. A, F, J

28. දෙමළ සිසුන් අතර ඉංග්‍රීසි අධ්‍යාපනය නංවාලීමට කටයුතු කිරීම හා සම්බන්ධ තොරතුරු ඇතුළත් නිවැරදි පිළිතුර මින් කුමක්ද?
1. A, E, I
2. C, H, J
3. D, G, L
4. B, F, K

29. මෙරට මිෂනාරී සංවිධාන ලේඛන මාධ්‍ය මගින් තම ආගම පැතිරවීමට ක්‍රියා කළ ආකාරය දැක්වෙන තොරතුරු අඩංගු පිළිතුර මින් කුමක්ද?
1. D, H, L  2. C, G, I  3. B, H, J  4. A, F, K

30. මෙරටට බ්‍රිතාන්‍යයන් ලබා දුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ වලින් බලය හා වගකීම වෙන්කල ආණ්ඩුක්‍රමය වන්නේ මින් මක්ද?
1. මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ
2. මැනිං ඩෙවෝන්ෂයර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ
3. ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ
4. සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ

31. මෙරට මුහුදුබඩ ප්‍රදේශවල ලන්දේසි බලය පැවති සමයේ ඔවුන් අපනයනය ඉලක්ක කර ගනිමින් වගාකළ බෝගයන් වන්නේ,
1. එනසාල්, සාදික්කා  2. තේ, රබර්  3. කුරුඳු, ගම්මිරිස්  4. පොල්, පුවක්

32. අතීතයේ රජුට අවශ්‍ය සේවා සපයන නිලධාරීන්ට යැපීම සඳහා ලබා දුන් ඉඩකඩම් හඳුන්වන්නේ මින් කුමන නමකින්ද?
1. පරවේණි ඉඩම්
2. නින්දගම් ඉඩම්
3. සේවා පරවේණි ඉඩම්
4. ගබඩාගම් ඉඩම්

33. පහත සඳහන් සිදුවීම් සිදු වූ කාල වකවානු අනුව, අනුපිළිවෙලින් සැකසූ විට නිවැරදි පිළිතුර වන්නේ මින් කුමක්ද?

A - සර්වජන ඡන්දබලය ලබා දීම.
B - අමද්‍යප ව්‍යාපාරය ආරම්භ කිරීම.
C - ලංකා ජාතික සංගමය පිහිටුවීම.
D - ලංකා සංගමය පිහිටුවීම.

1. DBCA  2. BCDA  3. ACBD  4. CDAB

34. මෙරට මුල්වරට දේශපාලන පක්ෂ ක්‍රමය පදනම් කරගෙන පාර්ලිමේන්තුවට සාමාජිකයන් තෝරා පත් කර ගන්නේ මින් කුමන ආණ්ඩුක්‍රමයෙන්ද?
1. ඩෙවෝන්ෂයර් ආණ්ඩුක්‍රමයෙන්
2. 1972 ජනරජ ආණ්ඩු ක්‍රමයෙන්
3. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රමයෙන්
4. සෝල්බරි ආණ්ඩු ක්‍රමයෙන්

- පහත A සිට B දක්වා ඇති ප්‍රකාශ ඇසුරින් 35 – 38 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - 1. මුද්දර පනත
2. ඇමරිකන් විප්ලවය

B - 1. ස්ටේට් ජනරල් සභාව
2. තුන්වන පන්තියේ සාමාජිකයන්

C - 1. නැපෝලියන් බොනපාට්
2. රුසියන් විප්ලවය

D - 1. ස්වයංපෝෂිත අර්ථ ක්‍රමය
2. කාර්මික විප්ලවය

35. මෙහි දෙවැන්න පළමුවැන්නට සම්බන්ධ කර නොගත් නිසා ගැටළුකාරී තත්ත්වයක් පැන නැගීම හා සම්බන්ධ පිළිතුර වන්නේ මින් කුමක් ද?
1. C  2. A  3. B  4. D

36. මෙහි ප්‍රධාන වශයෙන් පළමුවැන්න හේතු කොටගෙන දෙවැන්න ආරම්භ වීම දැක්වෙන පිළිතුර මින් කුමක්ද?
1. D  2. A  3. B  4. C

37. පළමුවැන්න බිඳවැටීමට දෙවැන්න මූලිකත්වය ගත් පිළිතුර මින් කුමක්ද?
1. D  2. C  3. B  4. A

38. පළමුවැන්න හා දෙවැන්න අතර කිසිම සම්බන්ධතාවයක් නොදක්වන පිළිතුර මින් කුමක් ද?
1. A  2. D  3. C  4. B

39. දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු විනාශයට පත් වූ යුරෝපයේ පරාජිත රටවල් නගා සිටුවීමට කටයුතු කළ ඇමරිකා එක්සත් ජනපදයේ හිටපු රාජ්‍ය ලේකම් වරයා මින් කවුරුන්ද?
1. වුඩ්රෝ විල්සන්
2. ජෝන් මාෂල්
3. වින්ස්ටන් චර්චිල්
4. ෆ්‍රෑන්ක්ලින් රූස්වෙල්ට්

40. දෙවන ලෝක යුද්ධය අතරතුර වර්ෂ 1942 ජනවාරි මස අක්ෂ බලවතුන්ට එරෙහිව සටන් කරන ජාතීන් 26 කගේ නම් ප්‍රකාශයට පත් කරන ලද්දේ මින් කුමන නගරයේ සිට ද?
1. ලන්ඩන්  2. නිව්යෝර්ක්  3. වොෂින්ටන්  4. පැරිස්

09396

# පෙරහුරු පරීක්ෂණය - 2023(2024)

| 11 ශ්‍රේණිය | ඉතිහාසය - II | කාලය: පැය 03 යි. |
|---|---|---|

සැලකිය යුතුයි,
- I කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට ද, III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.

## I කොටස

(1). (අ). පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමේ ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) දැදුරු ඔය(ජජ්ජර නදී), නාච්චදූව වැව, කඳුරුගොඩ විහාරය, කොත්මලේ ජලාශය, අලුගල්ගේ, දේව නගර, ලංකා පටුන, කාලතිත්ථ, මහියංගනය, සීතාවක රාජධානිය, තිරුකේතීෂ්වරම් කෝවිල, සීගිරිය (ල.12)

(ii) සිංගප්පූරුව, චෙන්නායි, අයිබීරියන් අර්ධද්වීපය, ඉස්තාම්බුල්, නාගසාකි, රතු මුහුද (ල. 6)

(ආ).(i) පහත A, B, C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරුවලට අදාළ පිළිතුරු අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - යාපහුව රාජධානි සමයෙහි මෙරට ආක්‍රමණය කළ ඉන්දියාවේ ප්‍රාදේශීය පාලකයා කවුරුන් ද?

B - ලාහුගල පිහිටි නිල්ගිරි සෑය නමින් හැඳින්වෙන පැරණි ස්තූපය අසල තිබූ සෙල්ලිපියක සඳහන් රජින කවුරුන් ද?

C - දෙවන ලෝක සංග්‍රාමය අතර තුර අත්ලාන්තික් ප්‍රඥප්තියට අත්සන් තැබූ ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපති කවුරුන් ද?

D - මුස්ලිම් ජනතාව තුළ ඉස්ලාම් ආගමික හා සංස්කෘතික ප්‍රබෝධයක් ඇති කළ පුද්ගලයා කවුරුන් ද? (ල. 4)

(ii) A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.


A



1. මෙහි දැක්වෙන ස්තූපය නම් කරන්න.
2. මෙය අයත් යුගය නම් කරන්න.
3. මෙය නිර්මාණය කළ රජතුමා කවුරුන් ද?
4. මෙම ස්ථානය පසුකාලීනව වල් බිහිවීමට හේතුව කුමක් ද?

(ල. 4)

B



1. මෙම රූපයේ දැක්වෙන ස්ථානය නම් කරන්න.
2. එය අයත් රට නම් කරන්න.
3. මෙම ස්ථානයට පහර දුන් රට නම් කරන්න.
4. මෙම සිදුවීම සම්බන්ධ ලෝක යුද්ධය නම් කරන්න.

(ල. 4)

## II කොටස

(2). i. ප්‍රාග් ඓතිහාසික මානවයා වාසය කළ පහත සඳහන් වාසස්ථානවලට අයත් ස්ථාන එක බැගින් පිළිවෙලින් සඳහන් කරන්න.

A - පහතරට තෙත් කලාපීය ලෙනක් -

B - තෙත් කලාපීය එළිමහන් වාසස්ථානයක් - (ල. 3)

C - වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථානයක් -

ii. පූර්ව ඓතිහාසික යුගයේ කාන්තාවන් තම රූ සපුව අලංකාර කළ බවට උඩරංචාමඩමින් හමුවන ශාක්ෂි දෙකක් සඳහන් කරන්න. (ල. 4)

iii. පූර්ව ඓතිහාසික යුගයේ දැකගත හැකි සුසාන ක්‍රම වර්ග දෙකක් දක්වා ඒවා නිර්මාණය කර ඇති ආකාරය උදාහරණ සහිතව විස්තර කරන්න. (ල. 5)

iv. මෙරට පැරණි සමාජයේ ප්‍රධාන ආර්ථික කටයුත්තක් වූ හේන් ගොවිතැන හා සත්ත්ව පාලනය සිදු වූ ආකාරය කරුණු තුනක් මගින් පැහැදිලි කරන්න. (ල. 6)

(3). i. පැරණි ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළෙහි දක්නට ලැබුණු පැරණි වරායන් තුනක් දක්වන්න. (ල. 3)

ii. පැරණි සමාජයේ අපේ මුතුන් මිත්තන් යකඩ නිස්සාරණය කිරීමේ තාක්ෂණය දැනගෙන සිටි බවට හමුවන ප්‍රධාන ප්‍රදේශ දෙක දක්වා එහි යකඩ නිස්සාරණය කර ඇති ආකාරය ඉදිරියෙන් සඳහන් කරන්න. (ල. 4)

iii. විද්‍යාත්මක භාවිතයේ පරිණතියත් සමඟ වියළි කලාපයේ ජල කළමනාකරණය පිළිබඳ වැඩි නැඹුරුවක් අතීත රජවරුන් දක්වා ඇත. මෙය,

A - ඇළමාර්ග හා අමුණු තාක්ෂණය

B - පොකුණු තාක්ෂණය ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 5)

iv. පැරණි සමාජය යහපත්ව පවත්වාගෙන යාමට අපේ පැරණි රජවරුන් නීතිය හා සම්ප්‍රදායන් යොදා ගනිමින් සමාජ විරෝධී හැසිරීම් පාලනය කර ඇත. එබඳු අවස්ථා තුනක් උදාහරණ සපයමින් විස්තර කරන්න. (ල. 6)

(4). i. පහත සඳහන් සිදුවීම් හා සම්බන්ධ පුද්ගලයින් කවුරුන්දැයි පිළිවෙලින් සඳහන් කරන්න.

A - යාපහුව කඳු මුදුනෙහි දුර්ගයක් පිහිටුවාගෙන එම ප්‍රදේශ සතුරන්ගෙන් රැක ගැනීම.

B - කාලිංග මාඝගෙන් රට මුදවා ගැනීම.

C - යාපන රාජධානියේ ආරම්භක පාලකයා. (ල.3)

ii. මහනුවර රාජධානි සමයෙහි දක්නට ලැබුණු කර්මාන්ත හතරක් නම් කරන්න. (ල.4)

iii. දෙවන නාගරීකරණයේ ආර්ථික රටාවේ දී, වාණිජ ආර්ථික රටාවකට ක්‍රමයෙන් නැඹුරු වූ ආකාරය කරුණු දෙකක් මගින් පැහැදිලි කරන්න. (ල.5)

iv. මහනුවර රාජධානි සමයෙහි පැවති ග්‍රාමීය සමාජය පවත්වාගෙන ගිය ආකාරය කරුණු තුනක් මගින් පැහැදිලි කරන්න. (ල. 6)

(5). i. A - වර්ෂ 1602 දී මෙරටට පැමිණ පළමුවන විමලධර්මසූරිය රජු මුණ ගැසුණු ලන්දේසි දූතයා,

B - පළමුවන විමලධර්මසූරිය රජුගෙන් පසු උඩරට රාජධානියට නව වැදගත් කමක් ලබා දුන් රජු,

C - ලන්දේසීන් සමඟ 1766 වර්ෂයේ සාම ගිවිසුමක් අත්සන් කළ රජු පිළිවෙලින් සඳහන් කරන්න. (ල.3)

ii. යාපනය රාජධානිය බිඳවැටීමට හේතු වූ කරුණු දෙකක් සඳහන් කරන්න. (ල. 4)

iii. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල පෘතුගීසි බලය ව්‍යාප්ත කිරීමට ඔවුන් අනුගමනය කළ උපක්‍රම දෙකක් දක්වා විස්තර කරන්න. (ල. 5)

iv. උඩරට රාජ්‍ය සම්බන්ධ ලන්දේසීන්ගේ ප්‍රතිපත්තියේ කැපී පෙනෙන එක් ලක්ෂණයක් හා උපරිම ආර්ථික වාසි ලබා ගැනීමේ ලන්දේසීන්ගේ ප්‍රතිපත්ති දෙකක් දක්වා විස්තර කරන්න. (ල. 6)

(6). i. පහත සඳහන් මධ්‍යස්ථාන තම පෙරදිග වෙළෙඳ මධ්‍යස්ථාන ලෙස පවත්වාගෙන ගිය රටවල් නම් කරන්න.

A - චෙන්නායි B - බතාවිය C - ගෝව (ල. 3)

ii. ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම, මෙරට මුහුදුබඩ ප්‍රදේශ පාලනය කළ කාලයෙහි ඔවුන්ට එරෙහිව මෙරට වැසියන් ඇති කළ කැරැල්ලට හේතු වූ කරුණු දෙකක් නම් කරන්න. (ල. 4)

iii. 1803 වර්ෂයේ ඉංග්‍රීසීන් විසින් උඩරට රාජධානිය ආක්‍රමණය කළත්, එය අසාර්ථක වීමට බලපෑ කරුණු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)

iv. 1818 වර්ෂයේ ඉංග්‍රීසීන්ට එරෙහිව මෙරට වැසියන් ආරම්භ කළ නිදහස් අරගලයට බලපෑ හේතු දෙකක් හා දෙවන නිදහස් අරගලයට බලපෑ ආසන්නතම හේතුව කුමක්දැයි වෙන වෙනම විස්තර කරන්න. (ල. 6)

(7). i. මහවැලි ගංගාවෙන් පෝෂණයවන ජලාශ තුනක් නම් කරන්න. (ල. 3)

ii. 1972 වර්ෂයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් මූලික මිනිස් අයිතිවාසිකම් හා නන්වැදෑරුම් නිදහස ගැන සඳහන් මූලික කරුණු දෙකක් සඳහන් කරන්න. (ල. 4)

iii. නිදහසින් පසු මෙරට සෞඛ්‍ය සේවයේ දියුණුවක් ඇති කිරීමට රජයන් ගත් උත්සාහයන් දෙකක් දක්වා විස්තර කරන්න. (ල. 5)

iv. නිදහසින් පසු මෙරට කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ සිදු වූ සංවර්ධනය කෙසේදැයි කරුණු තුනක් මගින් විස්තර කරන්න. (ල. 6)

## III කොටස

(8). i. පුනරුද යුගයේ පල්ලියේ ආධිපත්‍ය විවේචනය කළ පහත සඳහන් රටවල පුද්ගලයන් කවුරුන්දැයි පිළිවෙලින් සඳහන් කරන්න.

A - එංගලන්තයේ,

B - ප්‍රංශයේ,

C - බොහිමියාවේ, (ල. 3)

ii. පුනරුද යුගයේ සාහිත්‍යමය වශයෙන් සේවයක් කළ පුද්ගලයන් දෙදෙනකු හා විශ්වය පිළිබඳ නව මතයන් ඉදිරිපත් කළ පුද්ගලයන් දෙදෙනකු සඳහන් කරන්න. (ල. 4)

iii. යුරෝපයේ ඇති වූ පුනරුදය දේශපාලනික වශයෙන් නවෝදයක් ඇති වූ ආකාරය කරුණු දෙකක් මගින් විස්තර කරන්න. (ල. 5)

iv. පුනරුදය ගෝලීය වශයෙන් ව්‍යාප්ත වූ ආකාරය කරුණු තුනක් මගින් උදාහරණ සහිතව විස්තර කරන්න. (ල. 6)

(9). i. A - කුඩා රාජ්‍යයන් එකතු කොට ජර්මනිය යනුවෙන් රටක් බිහිකළ පුද්ගලයා,

B - සරයේවෝ සිදිධියේ දී ඔස්ට්‍රියාව යුධ ප්‍රකාශ කළ රට,

C - ජාතීන්ගේ සංගමය ආරම්භ කිරීමට මුල් වී කටයුතු කළ ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපති කවුරුන්දැයි පිළිවෙලින් සඳහන් කරන්න. (ල. 3)

ii. පළමුවන ලෝක යුද්ධයෙන් පසු ඇති වූ ජාතීන්ගේ සංගමයේ කටයුතු සාර්ථක වූ අවස්ථා දෙකක් සඳහන් කරන්න. (ල. 4)

iii. දෙවන ලෝක මහා සංග්‍රාමයට මුල් වූ අක්ෂ බලවතුන්ට අයත් රටවල් දෙකක ක්‍රියාකලාපය සැකෙවින් විස්තර කරන්න. (ල. 5)

iv. වර්තමානය වන විට එක්සත් ජාතීන්ගේ සංවිධානයට ලෝක යුධ තත්ත්වයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට සිදුව ඇත. ඒ සඳහා ඔවුන්ට ගත හැකි ක්‍රියාමාර්ග තුනක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ල. 6)

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ඉතිහාසය - 2023(2024)

11 ශ්‍රේණිය පෙරහුරු පරීක්ෂණය - පිළිතුරු පත්‍රය

1 පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 4 | 21. | 2 | 31. | 3 |
| 02. | 4 | 12. | 2 | 22. | 4 | 32. | 3 |
| 03. | 1 | 13. | 3 | 23. | 3 | 33. | 1 |
| 04. | 1 | 14. | 3 | 24. | 3 | 34. | 4 |
| 05. | 1 | 15. | 3 | 25. | 2 | 35. | 3 |
| 06. | 4 | 16. | 4 | 26. | 2 | 36. | 2 |
| 07. | 2 | 17. | 2 | 27. | 1 | 37. | 1 |
| 08. | 1 | 18. | 3 | 28. | 3 | 38. | 3 |
| 09. | 4 | 19. | 1 | 29. | 4 | 39. | 2 |
| 10. | 3 | 20. | 3 | 30. | 2 | 40. | 3 |

දෙවන පත්‍රය

1 කොටස

01. (ආ) (1) A - ආර්ය චක්‍රවර්තී

B - චූල සීවලී බිසව

C - ෆ්‍රැන්ක්ලින් රූසුවෙල්ට්

D - ඇම්.සී.සිද්දි ලෙබ්බේ මහතා

(11). A 1 - ථූපාරාමය

2 - අනුරාධපුරය

3 - දේවානම්පිය තිස්ස රජු

4 – කාලිංග මාඝගේ ආක්‍රමණ

B 1 - පර්ල් වරාය

2 - ඇමරිකා එක්සත් ජනපදය

3 - ජපානය

4 - දෙවන ලෝක මහා සංග්‍රාමය

**11 කොටස**

02. 1. A - පාහියන්ගල ලෙන/ බටදොඹ ලෙන/ කිතුල්ගල බෙලිලෙන

B - බෙල්ලන්බැදි පැළැස්ස

C - මිනිහාගල්කන්ද/බූන්දල/ පතිරාජවෙල

11. ඇස් අඳුන් ගැල්වීමට යොදාගත් ලෝහ කූර

රතු කහ ගුරුගල් උරච්චි කිරීමට ගත් ගල්

...................

111. මහා ශිලා සම්ප්‍රදායට අයත් සුසාන

හරණී සුසාන

මැටි ඔරු ආකාරයේ සුසාන

1V. හේන් ගොවිතැන

- තමන්ට අවශ්‍ය ප්‍රමාණයේ ඉඩම් කොටසක් මහ කැලෑවකින් වෙන් කර ගැනීම.
- විශාල ගස් කලා ඉවත් නොකිරීම
- ගිනි තැබීමට පෙර සතුන්ට ඉවත් වීමට ශබ්දනගා කෑ ගැසීම.
- නවදැලි හේන
- වරක් දෙවරක් වගා කළ පසු අතහැර දැමීම
- හේන්වල වගා කරන භෝග වර්ග
- හේන් වගා කිරීමට හේන් හිමියන් ගන්නා වැයම
- හේන්වලින් අයකළ බදු
- .......................

සත්ත්ව පාලනය

- ගව පාලනය
- එළුවන්/කුකුලන් නිවෙස්වල ඇති කිරීම

03. 1. ගෝකණ්ණතිත්ථ / පල්වංක/ ලංකාපටුන

11. සමනළවැව ප්‍රදේශය - ස්වභාවික සුළංබලය යොදාගෙන

සිගිරියට නුදුරු අළකොළවැව දෙහිගහ ඇළුකන්ද ප්‍රදේශය - මයිනහම

111. ඇළමාර්ග හා අමුණු තාක්ෂණය

- අමුණක් නිර්මාණය කර ගන්නා ආකාරය
- මහවැලි ගගේ උමාඔයට පහළින් මිණිපේ අමුණ නිර්මාණය කර මිණිපේ ඇළ හරහා පොළොන්නරුවේ පහත් බිම් කරා ජලය ගෙනයාම
- වැවකින් තවත් වැවකට ජලය ගෙනයාම - උදා - යෝධ ඇළ
- මහවැලි ගගේ අතු ශාඛාවක්වන අඹන් ගග නක්කලමක හැඩය ගන්නා ස්ථානයක ඇළහැර අමුණ තනවා ඉන් වැව් පෝෂණය කිරීමට ඇළහැර ඇළ මගින් ජලය සැපයීම - කවුඩුල්ල/ මින්නේරිය /කන්තලේ/ගිරිතලේ

පොකුණු තාක්ෂණය

- පිරිසිදු ජලය ඇතුළට යාමත් අපිරිසිදු ජලය පිටතට යැමටත් වෙනම කාණු පද්ධති පොකුණුවල දක්නට ලැබීම
- කුට්ටම් පොකුනේ ජල පෙරණය
- විවිධ පාෂාණ වර්ග උපයෝගී කර ගනිමින් පොකුණු නිර්මාණය
- විවිධ අවශ්‍යතා සපුරා ගැනීම. - පරිසරයේ සිසිල්බව ආරක්ෂා කිරීම/ අලංකාරය සඳහා
- ............................

1V. - නීතිය හා සම්බන්ධ පැවති ආයතන දෙකක් ගැන සඳහන් වීම.(වදාළ සහ සභාව)

- නීති නියාමනය කිරීමට ආරක්ෂක නිලධාරීන් සිටි බව
- වැව් පරිපාලනයට හා රජයේ ඉඩම් පරිහරණය කිරීම සම්බන්ධව බදු අය කිරීම් පිළිබඳ නීති දක්නට ලැබීම
- වරායවල් මඟින් රේගු බදු අයකර ගැනීම
- නීති උල්ලංඝනය කළ අයට දඩුවම් කිරීමට උසාවි පද්ධතියක් තිබීම
- පරිසරය සුරැකීමට නිති පනවා තිබිම
- වෙළෙඳාම හා සම්බන්ධ නීති දක්නට ලැබීම ( බදුලු ටැම් ලිපිය)
- ..........................

04. 1. A - සුභ සෙනෙවි
B - දෙවන පරාක්‍රමබාහු රජු
C - විජය කුලංකෙ ආර්ය චක්‍රවර්ති

11. යකඩ/දැව / ලෝහ/ ලාක්ෂා / පන්/ වෙඩි ලුණු

111. - ආහාර සඳහා වවන ලද අතිරික්තය වෙළෙඳාම සඳහා යොමු කිරීම
- විදේශ රටවල් සමග පැවති වෙළෙඳ සබඳතා වර්ධනය වීම
- කුරුඳුවලට ප්‍රධාන තැනක් ගැනීම
- මුතු මැණික් /ඇතුන්/ ඇත්දළ අපනයනය කිරීම
- විදේශ වෙළෙඳාම රජුගේ ඒකාධිකාරය පැවතීම
- වෙරළබඩ නැව් තොටු ආශ්‍රිත සරුසාර වෙළෙඳාමක් තිබීම
- .............................

1V. - ගම ස්වයංපෝෂිත වීම
- සමාජ සබඳතා කුල ක්‍රමය මත පදනම් වීම
- ඒ ඒ කුලවලට වෙන් වූ ආර්ථික කටයුතු කිරීම
- කුල ක්‍රමය අනුව ආවාහ විවාහ කටයුතු සිදුවීම
- විවාහ ක්‍රම තුන
- අත්තම් ක්‍රමය
- ..........................

05. 1. A - ජොරිස්වැන් ස්පිල්බර්ජන්
B - දෙවන රාජසිංහ රජු
C - කීර්ති ශ්‍රී රාජසිංහ රජු

11. යාපනයේ උරුමකරුවන් අතර බල අරගලය නිසා ජනතාව බෙදී සිටීම
නිත්‍ය හමුදාවක් නොසිටීම
ස්වභාවික ආරක්ෂාව නොමැති වීම

111. - පෘතුගීසීන් කෝට්ටේ රාජ්‍ය තුළ සිටි මුස්ලිම්වරුන්ට එරෙහිව කටයුතු කිරීමට බුවනෙකබාහු රජු පොළඹවා ගැනීම

- කෝට්ටේ පාලනයට පෘතුගීසීන් ඇඟිලි ගසමින් උපායශීලීව කටයුතු කිරීම
- පෘතුගීසීන් කෝට්ටේ වැසියන්ගේ නිෂ්පාදන අඩු මිලට ගැනීමත් ඔවුන්ගේ භාණ්ඩ වැඩි මිලට ලබා දීමටත් කටයුතු කිරීම
- ධර්මපාල රජු පෘතුගීසි ගැති පාලකයෙකු වීම
- තෑගි ඔප්පුවක් මඟින් පෘතුගීසීන්ට කෝට්ටේ බලය පැවරීම
- ..........................

1V. උඩරට සම්බන්ධයෙන් ලන්දේසි ප්‍රතිපත්ති

- ලන්දේසි වෙළෙඳ සමාගමට පාඩු සිදුවන ගැටුම්වලින් වැලකී සිටීම
- උඩරට රජුගේ හොඳ හිත දිනා ගැනීමට තෑගි බෝග දීම
- උපසම්පදා වැනි කටයුතුනලට නැව් ලබා දීම

උපරිම ආර්ථික වාසි ලබා ගැනීම

- උඩ රට රජු වෙනත් විදේශිකයන් සමඟ වෙළෙඳ සබඳතා පැවැත්වීම හැකිතරම් අවම කිරීම
- රජු සමඟ ගැටුම් ඇති වූ විට කඩවත් වසා දැමීම
- පහතරට වී වගාව දියුණු කිරීම
- කුරුඳු වගා කිරීම හා කුරුඳු වගාව ආරක්ෂා කිරීම
- වෙනත් වගා සිදු කිරීම ( උක්/ කෝපි/ කපු/ ගම්මිරිස් )

06. 1. A – බ්‍රිතාන්‍ය
B - ඕලන්දය (නෙදර්ලන්තය )
C - පෘතුගාලය

11. - නව බදු පැනවීම
- බදු මුදලින් ගෙවීමට නියම වීම
- දේශීය බදු එකතුකරන්නන් වෙනුවට මදුරාසියෙන් ගෙන්වන ලද අය බදු එකතු කිරීමට යොමු කිරීම.(අවුමිල්දාර්වරු )

111. - වැසි සමය ආරම්භ වීම හා ලෙඩ රෝග පැතිරීම
- මුත්තුසාමිට ජනතා සහයෝගය නොමැති වීම
- කොළඹ සමඟ සබඳතා බිඳ වැටීම
- උඩරටියන්ගේ ගරිල්ලා සටන් ක්‍රම
- රජතුමන්ගේ උපායශීලී කෞෂලය

1V. 1818 නිදහස් අරගලයට බලපෑ හේතු

- නිදහස අහිමිවීම හා රජෙකු නොමැතිවීමේ පසුතැවිල්ල
- ආගම හා සංස්කෘතියේ ආරක්ෂාව පිළිබඳ ගැටලු මතුවීම
- උඩරට ප්‍රභූ පන්තියට පහර වැදීම
- ඌව වෙල්ලස්ස මොහන්දිරම් තනතුරට හජ්ජි මරික්කාර් නම් මුස්ලිම් ජාතිකයෙකු පත් කිරීම

දෙවන නිදහස් අරගලයට ආසන්නතම හේතුව

- ටොරින්ටන් සාමිවරයාගේ බදු ප්‍රතිපත්තිය

07. 1. කොත්මලේ/ වික්ටෝරියා/ රන්දෙණිගල/ රන්ටැඹේ

11. - නීතිය පසිඳලීම, ක්‍රියාත්මක කිරීම හා නීතියේ රැකවරණය සර්ව සාධාරණ විය යුතුයි
- නීතියට අනුකූලව මිස පුද්ගලයකුගේ ප්‍රානයට , නිදහසට, හෝ සුරක්ෂිත භාවයට හානි නොකළ යුතුයි.
- සෑම පුරවැසියකුටම සිතීමේ නිදහසට, හෘද සාක්ෂියේ නිදහසට, හා ආගමික නිදහසට අයිතිය

තිබේ
- පුරවැසියන්ට සාමකාමීව රැස්වීමට හා අදහස් ප්‍රකාශ කිරීමට නිදහස තිබේ.

111. - ග්‍රාමීය ප්‍රදේශවල රෝහල් ඉදි කිරීම
- මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා දියුනු කිරීම
- ප්‍රතිශක්තිකරණ එන්නත් ලබා දීම
- වෛද්‍ය සායන පැවැත්වීම
- දේශීය වෛද්‍ය ක්‍රම දියුණු කිරීම

1V. - වී ගොවිතැන දියුණු කිරීමට කටයුතු කිරීම
මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ
ගොවිජනපද පිහිටුවීම
- සුළු අපනයන භෝග වගාව දියුණු කිරීමට කටයුතු කිරීම
- ව්‍යාපාරික කෘෂිකර්මාන්තය (තේ/ පොල්/ රබර් )දියුණු කිරීමට කටයුතු කිරීම

111 කොටස

08. 1. A - ජෝන් වයික්ලිප්
B - ඉරාස්මස්
C - ජෝන් හස්

11. සාහිත්‍ය
- ඩාන්ටේ
- පෙට්රාක්
- බොකැෂියෝ
- සර් තෝමස් මුවර්
- ප්‍රැන්සිස් බේකන්
- විලියම් ෂේක්ස්පියර්
- ඉරාස්මස්

විශ්වය පිළිබඳ නව මත
- නිකලස් කොපර්නිකස්
- ජොහැන්නස් කෙප්ලර්
- ගැලීලියෝ ගැලීලි
- අයිසෙක් නිවුටන්

111. - ජාතික රාජ්‍ය බිහිවීම
- රජු පාලන කටයුතුවල දී වැදගත් වීම
- වංශාධිපතිවරුන්ට තිබූ බලතල ඔවුන්ගෙන් ගිලිහීම
- රජු මධ්‍යම පාන්තිකයන් සමඟ එකතු වීම
- .............................

1V. - විවිධ රටවලට පුනරුදය ව්‍යාප්ත වීම - ආසියා / අප්‍රිකා/ ඇමරිකා
- යුරෝපා ජාතීන් යටත් විජිත ඇති කර ගැනීමට පෙළඹීම
- මුද්‍රණ කර්මාන්තය ලොව පුරා ප්‍රචලිත වීම
- යටත් විජිතවල ධනවතුන්ගේ දරුවන්ට අධ්‍යාපන කටයුතු සඳහා යුරෝපයට යා හැකි වීම
- තම ආගම ව්‍යාප්ත කිරීමට කටයුතු කිරීම
- ............................

09. 1. A - ඔටෝවෝන් බිස්මාර්ක්
B - සර්බියාව
C - වුඩ්රෝ විල්සන්

1 . - ස්වීඩනය හා පින්ලන්තය, ජර්මනිය හා පෝර්ලන්තය, ග්‍රීසිය හා බල්ගේරියාව, ඉරනෙය හා තුර්කිය වැනි රටවල් අතර සිදු වූ යුධ ගැටුම් නැවතීම
- සරණාගතයන් පුනරුත්තාපනය සඳහා මැදිහත්ව කටයුතු කිරීම
- පළමුවන ලෝක යුද්ධයෙන්පසුව ජාතීන්ගේ සංගමයේ භාරකාරත්වයට පත් කොට තිබූ යටත් විජිත පිළිබඳ අධීක්ෂණ කටයුතු සාර්ථකව සිදු කිරීම
- නීති විරෝධී වහල් වෙළෙඳාම හා මත්ද්‍රව්‍ය වෙළෙඳමෙ අඩපන කිරීමට අවශ්‍ය කටයුතු කිරිම

111. ජර්මනිය , ඉතාලිය හා ජපානයේ ක්‍රියාකාරීත්වයන් විස්තර කිරීම

1V. - සාම සාකච්ඡාවලට යොමු කි්රීම
- ආර්ථික සම්බාධක පැනවීම
- න්‍යෂ්ටික අවි තැනීම සීමා කිරීම හා පාලනය කිරීම සඳහා කටයුතු කිරීම
- සාම සාධක හමුදාව යෙදවීම



